බ්ලොග් කතන්දර

ලංකෙන්ඩියා - ලංකාවටයි ඉන්දියාවටයි පොදු භාෂාවක්

මට මේ කතාව කිව්වෙ පිටරට ඉගෙන ගත්තු මගෙ යාළුවෙක්.
මේ කියන යාළුවා රුසියාවෙයි ඉගෙන ගෙන තියෙන්නෙ. හැබැයි මේ කතාවට ඉන්දියන්කාරයෙකුත් සම්බන්ධයි.

ඔන්න ඉතිං මගෙ හිතවතා ගියා රුසියාවෙ ඉගෙන ගන්න ස්කොලර්ෂිප් එකක් ලැබිලා. මිනිහ එහෙදි හතරවුණු විශ්ව විද්‍යාල තේරාසිකාගාරයේ හිටියෙ ඉන්දියන්කාර රූම් මේට් කෙනෙක්.

මුලදි, මුලදි දෙන්න කතාබහ කළේ දන්න ඉංගිරිසියෙන්. ටික ටික රුසියන් භාෂාව ඉගෙන ගන්න කොට නොදන්න රුසියන් වලිනුත් කතා කරන්න හැකිවුනා.

හැබැයි විව්ධ අවස්ථා ඇවිල්ල තියෙනව මේ දෙන්නට, රුසියන් සහ ඉංගිරිසි වලට අමතරව වෙන භාෂාවකින් කතාකරන්න අවශ්‍ය වුනු. ඒ අතිත් අයට, විශේෂයෙන් ම රශියන්ලටයි, ඒ එක්කම ඉංගිරිසි දන්න අයටයි නොතේරෙන්න.

මේ වෙනකොට දෙන්නට තේරිලා තිබුනෙ, ඉන්දියන්කාරයගෙ හින්දි භාෂාවටයි, ශ්‍රී ලාංකිකයගෙ සිංහල භාෂාවටයි පොදු සංස්කෘත භාෂාවෙ වචන තියෙන බව. හොඳම උදාහරණය තමා භාෂා කියන වචනයම. මේ සංස්කෘත වචන ඉන්දියන්කාරයටයි, අපේ පොරටයි දෙන්නටම තේරෙනව, හැබැයි වෙන උන්ට අණ්ඩර දෙමල

ඉතිං මුං දෙන්න දන්න දන්න වචන පාවිච්චි කරමින් හදාගත්ත මං මේ කියන ලංකේඩියා භාෂාව. (මේ හම දැම්මෙ මමයි 2009 නොවැම්බර් වල).

ඔන්න උදාහරණෙකට හිතමු මුං දෙන්න කොහෙ හරි ගිහින් ඉන්න කොට පිටි පස්සෙ ඉන්නව කියල හොඳ ලස්සන කෙල්ලෙක්. මේ බව මුලින් දකින එකා අනිකට කියනව මෙන්න මෙහෙම.

දක්ෂිණා දිශා, සුන්දර් ස්ත්‍රී.

හොරුහෙන් ඒ දිහා කාටවත් නොතේරෙන විදියට බලන අනිකා උත්තර දෙනව මෙහෙම.

උත්කර්ෂ ස්ත්‍රී විශාල් පයෝධර්. චිත්තශ් ප්‍රීති

වැඩේ තේරුණා නේද?

මුං දෙන්න ඔය ආකාරයට මේ ලංකේන්ඩියා භාෂාවෙන් කතාකර කර හරි පොලියක් වින්ද. භාෂාවත් එන්න එන්නම දියුණු වුණා. හැබැයි ඔන්න එක දවසක් වැඩේ වැරදුණා.

ඒ කතාව පස්සෙ දවසක කියන්නම්

දිනපොතේ රහස්

අපි හැමෝම වගේ දින පොත් ලියල තියෙනව කෙටි කාලෙකට හරි මගෙ ගිනේ. සමහර දිනපොත් ලෝක ප්‍රසිද්ධ කෘති බවට පත්වෙලාත් තියෙනව. හොඳම උදාහරණය තමයිඃ නාට්සි ජර්මනියේ ඇන් ෆ්‍රෑන්ක් ලියූ දිනපොත.

මං ඉස්සෙල්ලාම දිනපොතක් ලියන්න පටන් ගත්තේ හයේ පන්තියෙ ඉඳිද්දි වගෙයි මට මතක. ඒ දිනපොත අඟල් 4x3 විතර කුඩාම කුඩා ප්‍රමාණයේ අර කුඩා සටහන්, ඇපොයින්ට්මන්ට්ස් වගෙ දේවල් ලියන්න ගන්න ජාතියෙ එකක්. ඒ මදිවට ඒක ඊට කලින් අවුරුද්දෙ එකක්. ඉතිං හැම සටහනක් ම ලිව්වෙ දවස වෙනස් කරලායි.

අපි කුලියට හිටපු ගෙදර අයිතිකාරයින් ගේ ගෙදර තිබුනෙත් ඒ අක්කර දෙකක් විතර විශාල වත්තේ ම යි. ගෙවල් දෙක මැද්දෙ හරියෙ තිබුන විශාල වෙරළු ගහක්. මං ඉස්සෙල්ලාම දිනපොතේ සඳහන් කරන්න පටන් ගත්තෙ හැමදාම උදේට නැගිටල ගිහින් ඇහිදපු වෙරළු ගෙඩි ගණනයි.

වෙරළු අවාරෙ ආවහම ඒ දින පොත ලිව්මත් ටිකෙන් ටික අඩුවෙලා අන්තිමේ දි නතර වෙලා ගියා.

එහෙම වුනත්, ඊළග අවුරුද්දෙත් මට පරණ දිනපොතක් හම්බ වුනා. වැඩිගිටියෙක් පාවිච්චි කරපු. ඉඳහිට දවසක ඉලක්කං කීපයක්, වියදම් වුණ ගණන් විය යුතුයි, විතරයි ලියල තිබුනෙ. ඒවා කවු ගාල ආයෙත් මං දිනපොත ලියන්න පටන් ගත්ත. වෙරළු ගැන, අඹ ගැන, පාසල් ගියා, ගියේ නෑ වගේ කෙටි සටහන්.

ඔහොම අවුරුදු කීපයක් ගතවුනා.

මගේ දිනපොත් ලිව්මේ උච්චතම අවස්ථාව එළඹුනේ මං ඒ ලෙවල්ස් කලාට පස්සෙ අවුරුද්දෙයි.

විභාගෙන් පස්සෙ අම්මලගෙ ගමේ ගිහින් සැප්තැම්බර්, ඔක්තෝම්බර් කාලෙ ගත කරපු මට ආපහු ගෙදර එන්න කලින්ම ගමේ ඇංකල් කෙනෙකුගෙන් තෑගි ලැබුනා ඊළග අවුරුද්දෙ අළුත් ම අළුත් දිනපොතක්. බී.සී.සී. කියන කොම්පැණියෙ එකක්.

ජීවිතයේ පලමු වතාවට ජනවාරි පලමුවෙනිදා දවසක, ඒ අවුරුද්දේම දින පොතක ලියන්න මට වරම් ලැබුණා.

ඒක එසේ මෙසේ දින පොතක් නෙමේ. විශාල එකක්. සතියේ දිනකට පිටුවයි. ඉරිද සෙනසුරාදට පිටු බාගෙ ගානේ. එක පිටක පේලි 25 ක් රූල් ගහල තිබුනා. මං කොච්චර ලියන්නෙක් වුනාද කියනව නම්, ඒ රූල් අතරත්, මාපින් වලත් ලියල එක පිටක පේලි 55 ක් පිරෙන්න ලිව්ව. වචන 500 ක් විතර එක දවසකට විතරක්.

එදා දවසෙ වුනු දේවල්. කෝච්චියෙදි, ටියුෂන් පන්තියෙදි දැක්ක, නොදැක්ක කෙල්ලො ගැන විස්තර, සිත් තැවුල්, දුක් අදෝනා විතරක් නෙමේ හැමදාකම මා සිත් ගත් සින්දුවක පදමාලාවත් ලිව්ව.

ඒ දින පොත අද තිබුන නම්, මගේ විශාලතම මැනුස්ක්‍රිප්ට් එක වෙන්නෙ ඒක.

එච්චර ලොකු දිනපොත් ඊට පස්සෙ කාගෙන්වත් හම්බ උනේ නෑ. ඒ නැතිවුනත්, මීට අවුරුද්දකට විතර පස්සෙ වෙන කොට වෙනත් විනෝදාංශවල පැටලිම නිසා තිබුණු පොඩි පනේ දින පොත් වුනත් පිරවුනේ යාන්තමට පේලි දෙක තුනකින් විතරයි.

නමුත් ලියපු දිනපොත් පුච්චන්නයි, ඇළුතින් ඒ වාගේ පොදුගලික විස්තර, සිත් තැවුල්, දුක් වේදනා, සංතාප, අදෝනා යනාදී මෙකී නොකී දේවල් ආයෙ නොලියන්නයි හේතුව උනේ, අපේ ගෙදර කටිටිය හොරෙන් මගේ දින පොත බලනව කියල තේරුණාට පස්සෙයි. අම්ම විතරක් නෙමේ මල්ලිලත්

බුදු අම්මෝ, වස ලැජ්ජාවෙ සන්තෝසෙ බෑ.

අර එක එක කෙල්ලො ගැන සිහින මවමින් සිත ඇතුලෙ තියාගෙන ඉඳල අන්තිමේ දී උන් කොල්ලො එක්ක සෙට් වෙලා ඉන්න හැටි දැකල ලියපු දේවල්, පස්සෙ ඇඟ පුරා බූට් කාල දුකෙන් ලියපු අදෝනා සේරම ගෙදර අය කියෙව්ව කියල දැන ගත්තහම ඇතිවුනේ මහ මුස්පේන්තු හැඟීමක්.

දින පොත් ලිව්ල්ල මං අල්ලල දැම්මා සදහටම.

හැබැයි පුච්චපු දිනපොත් ගැන නං මට දැං හොඳටෝම දුකයි.

අපරාදෙ නේද? දවසට එක ගානෙ කතන්දර ලියල බ්ලොග් එකට දාන්න තිබුන ඒව ආශ්‍රයෙන්.

කතන්දරකාරයා
http://kathandara.blogspot.com/

තවත් අදහසක්...

පසුගිය ලිපි කිහිපය තුලින් අප සාකච්ඡාවට භාජනය කරන ලද්දේ ලංකාවේ පවතින සමාජ, සංස්කෘතික සහ ආර්ථික වියවුල් සහගත භාවයත් අධ්‍යාපන ක්‍රමයේ පවතින අර්බුදකාරී තත්වයත් අතර පවතින අනෙහන්‍ය සම්බන්ධතාව ගැනයි. මෙම ලිපියෙන් එම සම්බන්ධතාවය පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරමු.

ලංකාවේ සමාජය, රාජ්‍යය සහ ප්‍රාග්ධනයේ ස්වභාවය නමැති ලිපියෙන් මා පෙන්වා දුන්නේ 1948න් පසු අනුගමනය කරන ලද විවිධ සමාජ ආර්ථික ප්‍රතිපත්තිවල උපාය මාර්-ගික සුසංගතභාවයක් සහ දිශාවක් (a strategic concordance and direction) නොමැති වූ බව යි. මේ නිසාවෙන් ධනේශ්වර සංවර්ධන මාවතේ කඩිනමින් ඉදිරියට ගමන් කරන්නට හැකි වන පරිදි ලාංකීය සමාජයේ පැවති හා පවතින වැඩවසම් නශ්ධාවශේෂයන් ක්ෂය කර දමනවා වෙනුවට, එම වැඩවසම් නශ්ධාවශේෂ යලි පණ ගන්වා තහවුරු කොට ශක්තිමත් කොට සමාජය ආපසු ඇද ගෙන යන්නට අප කටයුතු කොට තිබේ. ඒ අනුව ධනේශ්වර සංවර්ධිත සමාජයක්

බිහි කර ලන ආකාරයේ ප්‍රයත්නයකට අප සැබෑ ලෙසින්ම බාධා පමුණුවා අත. එවැනි ධනේශ්වර වර්ධනයක් සඳහා සුදුසු ආකාරයේ දේශපාලන සංස්කෘතියක් ගොඩ නැගීමට අවශ්‍ය සමාජ, ආර්ථික හා නෛතික රාමුවක් ගොඩනැගීම අත පසු කර දමා ඇත.

ලාංකීය අනන්‍යතාවයක් ගැන අවස්ථාවාදී ලෙස ඇතැම් විටෙක කථා බහ කෙරුණද, කිසි තැනක හෝ කිසි දිනෙක එය රටේ දේශපාලන සහ සමාජමය ප්‍රතිපත්ති තලයේ න්‍යාය පත්‍රය තුල අඩංගු නොකිරීමට රටේ පාලක පංතිය වග බලා ගත්තේය. මේ නිසා ලාංකීය සමාජයේ මූලික අවශ්‍යතාවයක් වන්නේ උපාය මාර්ගික සුසංගතභාවයක් සහ දිශාවක් පිළිබඳව සමාජ සම්මුතියක් ඇති කර ගැනීම යි. එවැන්නක් වර්ධනය වූ විට එම දීර්ඝ කාලීන උපාය මාර්ගික අභිමතාර්ථයන් සහ අරමුණු වලින් අන් අතකට ලාංකීය සමාජය යොමු කිරීම කෙටි කාලීන අවස්ථාවාදී දේශපාලන කණ්ඩායම් වලට තරමක් දුෂ්කර කාර්යයක් බවට පත් වනු ඇතැ යි මම කල්පනා කරමි.

ලාංකීය සමාජයේ ඇති කර ගත යුතුව තිබෙන උපාය මාර්ගික සුසංගතභාවය සහ දිශාව දෙස මඳක් හැරී බලමු. ජාතිය, භාෂාව, ආගම, කුලය, ප්‍රදේශය, පවුල සහ ලිංග භේදය අනුව භේද හින්න වී ගිය ලංකාවේ අද පවතින සමාජයේ හැම තලයකම උපාය මාර්ගික සුසංගතභාවය පිළිබඳ සංවාදය විවෘත ලෙස කරන්නට මං පාදු ගත යුතු බව මගේ අදහස යි. මෙහිදී මඟ හැර නො-ගිය හැකි මාතෘකා සහ විෂයයන් වන්නේ ලංකාවේ 'අයිති' කරුවන් සහ සමාජ අන්තර්ගතය (social inclusion), ඇති අය සහ නැති අය අතර පවතින පරතරය වැනි කරුණුයි. ස්වෛරීභාවය තීරණය කළ යුත්තේ රටේ බහුතරයේ උවමනා එපාකම් පමණක් සලකා බැලීමෙන් දෑ නැතහොත් රටේ පුරවැසියන් සියළු දෙනාගේ උවමනා එපාකම් සැලකිල්ලට ගෙන කටයුතු කිරීමෙන් දෑ එසේ නැතහොත් ඇති නැති අය අතර පවතින පරතරය වැඩි දියුණු වෙන ආකාරයෙන් කටයුතු කිරීමෙන් දෑ අද ලංකාවේ මෙවැනි කථා බහකට ඇත්තේ මඳ අවකාශයක් පමණකි.

උපාය මාර්ගික දිශාව විය යුත්තේ විවිධ ජන කොටස් අතර අනෙහන්‍ය සමාජ ආර්ථික සහ සංස්කෘතික සම්බන්ධතා ගොඩ නගන්නට පසුබිම සකස් කර ලන පරිදි රටේ පුරවැසියන් සියළු දෙනාගේ උවමනා එපාකම් සැලකිල්ලට ගෙන එකඟතාවයක් ඇති කර ගැනීමට කටයුතු කිරීමෙන් ය යන්න මගේ හැඟීම යි. එවැනි උපාය මාර්ගික දිශාවක් ඔස්සේ ගමන් ගැනීමට සූදනම් නම් උපාය මාර්ගික සුසංගතභාවය ඇති කර ගත හැක්කේ අධික ලෙස කේන්ද්‍ර ගත

ලංකාවේ ගුරු වෘත්තිය

කොට තිබෙන ධනේශ්වර රාජ්‍යය සමග විවිධ ජාතිකත්වයන් සහ ලිබිඩීන් විසින් ගොඩනගා ගෙන තිබෙන බරපතල ආකාරයේ ප්‍රතිවිරෝධතා සමණය කළ හැක්කේ කෙසේද යන්න ගැනද විවෘත සංවාදයක් දියත් කොට එකඟතාවයක් ඇති කර ගැනීමට කටයුතු කළ යුතුව තිබේ.

රජයේ සමාජ-ආර්ථික, සංස්කෘතික ප්‍රතිපත්ති මාලාව සහ ක්‍රියාමාර්ග මෙම උපාය මාර්ගික සුසංගතභාවය සහ දිශාව සමග මුළුමණින්ම අනුකූල විය යුතු ය. මේ අනුව ගත් විට රටේ පාලක පංතිය විසින් අනුගමනය කරනු ලබන ආර්ථික ප්‍රතිපත්තිය සහ අධ්‍යාපන ප්‍රතිපත්තිය ද, අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ග ද උපාය මාර්ගික සුසංගතභාවය සහ පොදු දිශාව සමග මුළුමණින් අනුකූල සහගත විය යුතු ය. 1948න් පසු කාල සීමාව තුල ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දෙස බැළුව හොත් පෙනී යන්නේ ඒවායේ ප්‍රතිඵලය වී ඇත්තේ රටේ පාසැල් පද්ධතිය මෙන්ම ඒවායේ ඉගෙනීම ලත් දූ දරුවන් ද තමන් කථා කළ භාෂාව අනුව, තමන් ඇදහූ ආගම අනුව ක්‍රම ක්‍රමයෙන් වඩ වඩාත් වෙන් කිරීමට භාජනය කිරීම බව යි. එවැනි බෙදීම් ඇති කළ, ඇති කරනු ලබන අධ්‍යාපන ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග සියළු පුරවැසියන් අන්තර්ගත කර ගන්නා ලාංකීය සමාජයක් ගොඩ නැගීම ට එරෙහිව පවතින මහත් බාධාවක් බව පැවසිය යුතුය.

අනෙක් අතට උසස් අධ්‍යාපනයක් ලබා ගන්නා

35 වන පිටුවට

ලයනල් බෝපගේ